Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019-10-30 |

පැමිණිලිකාරිය : එන්.පී. සෙනෙවිරත්න මිය.
අංක : 737/31, අලුත් මාවත පාර,
මෝදර, කොළඹ 15.

වගඋත්තරකරුවන් : සභාපති,
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

පැමිණිලි අංකය : **HRC/3467/16**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, රාගම, කැන්දලියද්දපාළුව, අංක : 865/111 බී දරණ නිවසේ තමා පදිංචිව සිටි බවත්, 1999 වර්ෂයේදී එකී නිවස කඩා ඉවත් කරන ලෙසට හා එම නිවස වෙනුවට දෙමහල් ගොඩනැගිල්ලේ නිවසක් ලබාදීමට කටයුතු කරන බව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් තමාට දැනුම්දීම් කර තිබූ බවත්ය. නමුත් මේ වනතෙක්ම එකී පොරොන්දු ප්‍රකාරව තමාට නිවසක් ලබා නොදුන් බවද සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම හා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදුකරන ලද පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

මෙම කරුණු සම්බන්ධයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති වෙතින් තොරතුරු ලබාගැනීමට කටයුතු කර ඇති අතර එම කරුණු දැක්වීමට අනුව මහර, ගල්වලවත්ත නමැති ඉඩමේ පවුල් 157 ක් අවිධිමත් ලෙස පදිංචිව සිටි බවත්, ඔවුන් සඳහා රු. 36,000/- ක ගෙවල් කුලී දීමනාවක් ලබාදීමෙන් අනතුරුව එම ස්ථානයෙන් ඉවත් කර කැමති ස්ථානයක පදිංචි වන ලෙසට



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

දැනුම්දී ඇති බවත් පසුව එම ඉඩම සංවර්ධනය කර1999 වර්ෂයේදී නිවාස ඉදි කිරීම් ආරම්භ කර ඇති බවත් සඳහන් කර ඇත.

පළමු අදියරේදී නිවාස 132 ක් ඉදි කොට පුනස්ථාපන පදනම යටතේ පවුල් 132 ක් පදිංචි කර ඉතිරි නිවාසලාභීන් 25 දෙනා සඳහා දෙවන අදියර යටතේ නිවාස 25 ක් ඉදිකරමින් පවතින අවස්ථාවේදී නිවාස ලැබිය යුතු 25 දෙනා අතරින් කිහිප දෙනෙකු සමග අනවසරකරුවන් පිරිසක් ඇතුළුව පුද්ගලයන් 25 දෙනෙකු එම නිවාස වලට බලෙන් ඇතුළු වී පදිංචි වී තිබූ බවත් මෙම පෙත්සම්කාරියගේ ස්වාමි පුරුෂයා වන සුගත් පුෂ්පකුමාර යන තැනැත්තාද නිවාස ලබා දිය යුතු මුල් සමීක්ෂණ ලයිස්තුවේ සිටි 25 දෙනා අතරින් එක් අයෙක් බවත් සඳහන් කර ඇත.

ඉහත සඳහන් කළ පරිදි අනවසරයෙන් පදිංචි වූවන් සඳහා මහර අධිකරණයේ නඩු පවරා නිවාස 18 ක හිස් භුක්තිය මෙම අධිකාරිය වෙත ලබාගත් නමුදු නැවත 2014 වර්ෂයේදී ඉදි කිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය ඇමතිවරයා විසින් පුද්ගලයන් 16 දෙනෙකු එකී නිවාස වල පදිංචි කර ඔවුන්ට යතුර භාරදීමේ කටයුතු සිදුකළ බවත් මෙම තත්ත්වය මත නිවාස හිමිවිය යුතු මුල් නිවාසලාභීන් හට නිවාස ලබාදීමට නොහැකි වූ බවත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිගේ 2016.10.21 දිනැති සහ අංක : 8/2/3/2/52 – II වෙළුම යන ලිපියට අනුව සඳහන් කර ඇත. මෙම කරුණු ඉදිරිපත් කරමින් තවදුරටත් සභාපතිවරයා විසින් සඳහන් කර ඇත්තේ හිස් භුක්තිය ලබාගත් නිවාස 02 ක් ඒ වනවිට හිස්ව පවතින බවත්, එම නිවාස 02 න් එක් නිවසක් සුගත් පුෂ්ප කුමාර මහතාගේ බිරිද වන එම්.පී. සෙනෙවිරත්න යන අයට ලබාදීමට තීරණය ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බවත්ය.

එහෙත් පසු කාලයේදී පෙත්සම්කාරිය විසින් ඇයට සහනයක් නොලද බවට දැනුම්දීම මත 2017.06.12 දිනට පාර්ශවයන් කොමිෂන් සභාව වෙත කැඳවා ඇත. මෙහිදී වගඋත්තර පාර්ශවය නියෝජනය කරමින් කිසිවෙකු පැමිණ නොමැති අතර එතෙක් සහන නොලද බව හැගී ගිය හෙයින් නැවත 2017.08.24 දිනට පාර්ශවයන් කැඳවා ඇත. වගඋත්තරකාර පාර්ශවය මෙදින කොමිෂන් සභාවට ඉදිරිපත් වෙමින් මෙම ගැටළුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2017.05.08 දිනැතිව කරුණු ඉදිරිපත් කිරීමක් සිදුකළ නමුදු මේවනවිටත් අදාළ ගැටළුව සම්බන්ධයෙන් ස්ථිර විසඳුමක් ලැබී නොමැති බවට දන්වා ඇත. ඒ අනුව අදාළ ගැටළුව සම්බන්ධයෙන් නැවත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන බවට කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි කළමණාකරු(දේපළ) විසින් සඳහන් කර ඇත.

එම පරීක්ෂණයෙන් අනතුරුව සභාපති, නිවාස සංවර්ධන අධිකාරියෙන් කොමිෂන් සභාව වෙත 2017.09.27 දිනැතිව නැවත වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවේද පෙර සඳහන් කර ඇති පරිදි මුල් නිවාසලාභීන් 16 දෙනෙකු හට නිවාස අහිමි වී ඇති බවත්, මෙම අවස්ථාව වනවිට

නිවාස 2 ක් හිස්ව පවතින බවත්, පැමිණිලිකරුවන් ඉල්ලා සිටිම පදනම් කරගෙන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු වාර්තා කර ඇති බවත් සඳහන් කර ඇත. එසේම මෙම වකවානුව තුල හිස්ව තිබූ නිවාස 02 තුලට අනවසර පදිංචිකරුවන් ඉබි යතුරු කඩා බලෙන් ඇතුළු වී සිටි බවට අධිකාරියේ තාක්ෂණ නිලධාරි විසින් වාර්තා කර තිබූ හෙයින් අනවසරකරුවන් ඉවත් කිරීමට දිස්ත්‍රික් කළමනාකරු ගම්පහ වෙත දැනුම්දී ඇති බවත්, මෙම තත්ත්වය මත උක්ත කී පැමිණිලිකරු වෙත නිවාස ලබාදීම සලකා බැලීමට හිස් නිවාස නොමැති බවත් කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත.

එමෙන්ම එකී වාර්තාව මගින් තවදුරටත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් සඳහන් කර ඇත්තේ, නිවාසලාභින්ට නිවාස ලබාදීම සඳහා අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතුව තිබූ නමුදු එම පුද්ගලයන් ඉවත් කිරීම සඳහා එක් වරක් අධිකරණ නියෝගයක් ලබාගෙන තිබීම මත නැවත අධිකරණ කටයුතු වලට එළඹිය නොහැකි බවට නීතිමය උපදෙස් ලැබී ඇති බවය. එබැවින් මෙම ගැටළුව මෙම පෙත්සම්කාරියට පමණක් නොවන බවත්, තවත් 16 දෙනෙකු සම්බන්ධයෙන් විසඳිය යුතු ගැටළුවක් බවත් ඉතිරි පුද්ගලයන්ට නිවාස ලබානොදෙමින් එක් අයෙකුට හෝ දෙදෙනෙකුට පමණක් ලබාදීමෙන් අනෙකුත් පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට නිරීක්ෂණය කරන බවත්ය.

කෙසේ නමුත්, මෙම ගැටළුවට සහනයක් නොලද හෙයින් අදාළ පාර්ශවයන්ද සමග අවස්ථා කිහිපයකදීම පරීක්ෂණ සිදුකර ඇති අතර, අවසාන වශයෙන් කැඳවීම් කළ 2017.12.19 දිනද පැමිණ සිටි වගඋත්තරකරුවන් විසින් නිසි පිළිතුරක් ලබාදීම සිදුවී නොමැත. ඒ අනුව මෙම පෙත්සම්කාරිය වෙත මෙතෙක් අදාළ සහනයන් නොලද බව පෙනී යයි.

නිරීක්ෂණ :-

ඉහත ගැටළුකාරී තත්ත්වය සම්බන්ධයෙන් කොමිෂන් සභාව මගින් පරීක්ෂණ සිදුකළ අතර, මෙහිදී ඉහත ලිපිනයේ පදිංචිව සිටි මෙම පෙත්සම්කාරිය අදාළ නිවසින් ඉවත් කිරීමේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිගේ අත්සනින් යුතුව අංක : 9/01/-4/125/02-04 සහ 1999.07.09 දිනැති ලිපියක් පෙත්සම්කාරිය වෙත ඉදිරිපත් කර ඇති බවට නිරීක්ෂණය විය. එකී ලිපියට අනුව "පෙත්සම්කාරිය දැනට සිටින නිවාසයෙන් (එකල) ඉවත් වන ලෙසට හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රතිසංවර්ධනය හා පැල්පත්වාසීන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ පෙත්සම්කාරිය පදිංචිව සිටි භූමි ප්‍රදේශයේ මහල් නිවාස ඉදි කිරීමට තීරණය කර ඇති බවටත්, ඒ අනුව අනවසර නිවාසයෙන් ඉවත් වන ලෙසටත්" දැනුම්දී ඇති බව නිරීක්ෂණය වේ. "එමෙන්ම, එකී නිවාසය වෙනුවට අළුතින් ඉදි කිරීමට යෝජනා කර ඇති දෙමහල් ගොඩනැගිල්ලෙන් නිවසක් ලබාදීමට අදහස් කරන බවත්, එකී නිවස ලබාගැනීම සඳහා මෙම ඉදිරිපත් කරන ලද ලිපිය හිමිකම

සනාථ කළ හැකි ලිපියක් ලෙස සලකන බවත්" නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිගේ අත්සනින් යුතු ඉහත කී ලිපියෙන් පෙත්සම්කාර පාර්ශවය වෙත දන්වා ඇත.

ඒ අනුව මෙම පැමිණිලිකාරිය දිගින් දිගටම නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හමුවී තමාගේ අසරණ තත්ත්වය කියාපාමින් නිවසක් ලබාදීමට කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බව පරීක්ෂණ අවස්ථාවන්හිදී පැහැදිලි විය. එමෙන්ම මෙම පෙත්සම්කාරියගේ ස්වාමියා නොමැති බවත්, ගැහැණු දරුවන් දෙදෙනෙකු සමග කුඩා කාමරයක කුලී පදනම මත ජීවත් වන බවත් ප්‍රකාශ වී ඇත.

කෙසේ නමුත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ලිඛිත තොරතුරු අනුව මෙම පෙත්සම්කාරිය හට නිවසක් ලබාදීමේ සුදුසු තත්ත්වයක සිටින බවට 2016.10.21 දින දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් ඉදිරිපත් කර ඇති ලිපියෙන් තහවුරු වේ. නමුත් වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන පරිදි අනවසර පදිංචිකරුවන් නිවාස වල පදිංචිවීම මත මෙම තැනැත්තියට නිවසක් ලබාදීමේ හිමිකම අහිමි වී ඇති බවට පැහැදිලි වේ.

තවද, අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නැවත අධිකරණයට කරුණු දැක්වීමට නොහැකි බව දන්වමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති විසින් පැමිණිලිකාරිය වෙත සහන සැලසීම සිදුනොකර සිටීම යුක්ති සහගත නොවන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්විය.

ඉහත කරුණු සම්බන්ධයෙන් සලකා බැලීමේදී වගඋත්තර පාර්ශවය තම වගකීම් වලින් බැහැරව කටයුතු කිරීමත්, අනවසර පදිංචිකරුවන් හෝ දේශපාලන බලපෑම් මත පදිංචිවූවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු නොකිරීම තුලින් සුදුසුකම්ලාභීන් සඳහා නිවාස ලබාදීමේ අවස්ථාව හිතාමතාම මග හැර ඇති බවත් නිරීක්ෂණය වේ.

එමෙන්ම, 1999. ජූලි 09 දිනැති ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිගේ අත්සනින් යුතුව "මහර ගල්වල අනවසරකරුවන් පදිංචි භූමි ප්‍රදේශයේ මහල් නිවාස ඉදිකිරීම" සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව කටයුතු නොකිරීම වගකිව යුතු නිලධාරීන්ගේ යුතුකම් හා වගකීම් පැහැර හැරීමක් ලෙස නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත කරුණු සියල්ල සැලකීමේදී ඉහත ලිපිනයේ පදිංචි පැමිණිලිකාරිය වෙත පදිංචියට සුදුසු නිවසක් ලබා ගැනීමේ හිමිකම යම් පාර්ශවයකගේ දේශපාලන බලය පෙරදැරිව අහිමි වී ඇති බවට වගඋත්තර පාර්ශවය විසින්ම ඉදිරිපත් කර ඇති කරුණු අනුව පැහැදිලි වේ.

මේ අනුව නිවාස අහිමිව සිටි පාර්ශවයන් අතුරින් එක් කණ්ඩායමකට දේශපාලන හෝ වෙනයම් හේතු සාදක මූලිකත්වයෙන් නිවාසයන්හි හිමිකාරත්වය ලැබීමේදී ඒ හා සමාන නිවාස අහිමි වූ මෙම පෙත්සම්කාරියට පදිංචියට සුදුසු නිවසක් ලබාගැනීමේ අයිතිය අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ. එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකාරිය වෙත අදාළ මහල් නිවාසයෙන් නිවසක් ලබා දීමේ හැකියාවක් නොමැති නම් ඇයට ජීවත් වීම සඳහා සුදුසු පරිසරයකින් සුදුසු වෙනත් නිවසක් හෝ ලබා දීමට වගඋත්තර පාර්ශවය විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019.12.09 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ගරු අමාත්‍යතුමා,
නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
2 වන මහල, සෙත්සිරිපාය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල.

B/